**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ("බැංකුව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ**

**1.5.1. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අනුගත වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වූ පුළුල් හස්තමය ක්‍රියාවලියක් නිරීක්ෂණය විය. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට සම්බන්ධ සටහන් පොදු ලෙජරයට ගැලපීමකින් තොරව සෘජුවම මූල්‍ය ප්‍රකාශන වලට සටහන් පැනවීම. | වසර අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අවශ්‍ය ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. කාර්යයන් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 සහ 09) බාහිර විගණකගේ නිරීක්ෂණ සමග සිදු කර අවසන් කර ඇත. ඉන්පසුව, වසර අවසාන මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන වෙත අදාළ ජ'නල් සටහන් පනවා තිබුණි. විගණකවරුන්ගේ මතය අපට ලැබුණු පසු, පොදු ලෙජර් වෙත ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සම්බන්ධ අදාළ සටහන් පනවා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| II. මධ්‍යම වගකීම් වාර්තාවක් නොතිබීම, තනි පුද්ගල සැලකිය යුතු ණය ක්‍රියාත්මක කිරීමේදී සමාලෝචන ක්‍රියාවලියක් සිදු නොවීම සහ හානිකරණ ගණනය කිරීම සඳහා තවදුරටත් වැඩිදියුණු කිරීම් අවශ්‍ය බව නිරීක්ෂණය විය. | තනි පුද්ගල සැලකිය යුතු ණය සීමාව මිලියන 10 දක්වා වැඩි කිරීමට බැංකුව කටයුතු කර ඇති අතර එය පහළ මට්ටමේ සිට තොරතුරු රැස්කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා අවම කරනු ඇත. එසේම, විෂයමූලික සාක්ෂි ඇගයීම් ක්‍රියාවලිය සහ මුදල් ප්‍රවාහ පුරෝකතනය අනාගත කටයුතු වලදී අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් ස්වාධීනව තක්සේරු කරනු ලැබේ. එබැවින් ඉදිරි වැඩ වලදී මෙම ගැටළුව නිවැරදි කරනු ඇත. | හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය නිරීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| III. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සහ විගණන සොයාගැනීම් මත නිතර ගැලපීම් සිදු කිරීම සහ විගණනයේ දී මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල පවතින වැරදි සහ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන බැංකුවේ වෙනම අංශයක් විසින් සමාලෝචනය නොකිරීම ප්‍රධාන වශයෙන් එම දෝෂවලට හේතු විය. | දැනට, අභ්‍යන්තර විගණන අංශය කාර්තුමය වශයෙන් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරමින් සිටී. මීට අමතරව, අවදානම් කළමනාකරණ අංශයට ද මාසික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය ස්වාධීනව සත්‍යාපනය කිරීමට සහ සහතික කිරීමට ඵලදායී පාලනයක් ඇති කිරීම. |

| | | |
|---|---|---|
| IV. එකම විස්තරය යටතේ පොදු ලෙජර ගිණුම් කිහිපයක් බැංකුව විසින් නිර්මාණය කර ඇති අතර එමඟින් අදාළ ලෙජර ගිණුම්වලට සටහන් ඇතුලත් කිරීමේදී ව්‍යාකූල වේ. තවද, සමහර ආදායම් ගිණුම් සම්බන්ධයෙන් ඍණ ශේෂයන් නිරීක්ෂණය විය. | මූල්‍ය වාර්තාවල අනුකූලතාව සහතික කිරීම සඳහා සාමාන්‍ය ලෙජර ගිණුම් පිළිබඳ ඉස්මතු කර ඇති ගැටළු නිවැරදි කිරීමට අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමු. | මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

### 1.5.2. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. කොවොයිඩ් 19- පොලිය සඳහා වූ අවිනිශ්චිත ගිණුම සැසඳුම් කිරීමට බැංකුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. බැංකුව විසින් රු.557,059,726 ක් ණය හිමියන්ට බැර කිරීමෙන් හා රු.52,457,212 ක් ණය ගැතියන්ට හර කිරීමෙන් ඉහත ගිණුම සැසඳුම් කර ඇත. තවද, ඉහත ශේෂයන් පිළිබඳ මධ්‍යගත මට්ටමින් පාරිභෝගිකයා අනුව වාර්තාවක් ලබා දීමට බැංකුවට නොහැකි විය. | බැංකුවේ අදාළ ශාඛා හා සම්බන්ධ ප්‍රති ගිණුම් අතර වෙනස නිවැරදි කිරීමට ක්‍රියා කරනු ඇත. | කොවොයිඩ් 19- පොලිය සඳහා වූ අවිනිශ්චිත ගිණුම සහ අදාළ ලැබිය යුතු ගිණුම් පිළිබඳ සැසඳුම් කිරීමට සහ CBSL විධානවලට අනුකූල නොවන පරිදි එකතු කරන ලද අතිරික්ත පොලිය ආපසු ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| II. ණය සඳහා ලැබිය යුතු පොලිය සම්බන්ධයෙන් සාමාන්‍ය ලෙජර් ශේෂය සහ හානිකරණ ගණනය කිරීම සඳහා සකස් කරන ලද ණය ශේෂ ප්‍රධාන ලැයිස්තුව අතර රු. 5,156,027 වෙනසක් නිරීක්ෂණය විය. | අනාගත නිවැරදි කිරීම් සඳහා සටහන් කර ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සමථයකට පත් කිරීමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| III. මුළු වටිනාකම රු.2,591,875ක් වූ ස්ථාවර තැන්පතු 94 ක්, පොලී නොගෙවා අලුත් කිරීමකින් තොරව වසර කිහිපයක සිට (වසර 8 සිට අවුරුදු 11 දක්වා) පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. | හඳුනාගත් ස්ථාවර තැන්පතු නිවැරදි කර ඒ සඳහා පියවර ගන්නා ලෙස සියලුම ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත. මෙවැනි ගැටළු අධීක්ෂණය කිරීම සඳහා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පත් කර ඇත. | එවැනි ගැටළු නිරීක්ෂණය කිරීම සහ නිවැරදි කිරීම සඳහා ඵලදායී පාලනයන් ස්ථාපිත කිරීම. |
| IV. 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ණය ගැතියන්ගේ පාලන ගිණුමේ රු.1,684,991 ක ණය ශේෂයක් නිරීක්ෂණය විය. | ණයගැතියාගේ පාලන ගිණුම සමන්විත වන්නේ පෙර පැවති ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ඒකාබද්ධ කිරීමේදී පොදු ලෙජර ශේෂයන්ගේ ඉතිරිව තිබූ ලැබිය යුතු මුදල් එකතුවෙනි. පැරණි | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ණය ගැතියන්ගේ පාලන ගිණුම සමථයකට පත් කිරීමට සහ අදාළ ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | | | |
|---|---|---|---|
| | | එල්.ඩී.බී. බැංකු පද්ධතියේ (එන්.ටී.පී.එල්) පවතින පද්ධති ගැටළු හේතුවෙන් මෙම ශේෂයන් සමහරක් අසාමාන්‍ය පොදු ලෙජර ශේෂයන්ගෙන් සමන්විත වේ. ඒ සඳහා වත්කම් ගිණුම්වල පවතින අසාමාන්‍ය සංඛ්‍යා නිවැරදි කිරීම සඳහා අපි තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඇත. කෙසේ වෙතත්, ඔවුන් ප්‍රකාශ කරන්නේ, එන්.ටී.පී.එල් බැන්ක්මේට් පද්ධතිය සඳහා විකුණුම්කරුගේ සහාය අවසන් කර ඇති බැවින්, පද්ධතිය මඟින් ජනනය වූ පිටතින් ඇතුළත් කරන ලද තනි සටහන් වල වලංගුභාවය පැහැදිලි කළ නොහැකි බවයි.<br>එබැවින්, අනාගත විමසීමකදී ශාඛා අන්තයෙන්/පාරිභෝගිකයාගෙන් කපා හැරීම ක්‍රියාවට නැංවිය නොහැකි බැවින් එවැනි ශේෂයන් මුළු ණයගැතියාගේ පාලන ගිණුමට මාරු කරන ලදී. | |
| V. | 2022 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් ශාඛාවල “පෙරගෙවුම් නෛතික ගාස්තු” ගිණුමේ රු.1,970,815 දක්වා එකතු වූ ණය ශේෂයන් නිරීක්ෂණය කරන ලදී. | මෙම පෙරගෙවුම් නෛතික ගාස්තු ගිණුම්වල පවතින බැර ශේෂයන් නිවැරදි කරන ලෙස සියලුම ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත. මෙවැනි ගැටළු අධීක්ෂණය කිරීම සඳහා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පත් කර ඇත. | පෙරගෙවුම් නෛතික ගාස්තු ගිණුම තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමට සහ අදාළ ගිණුමේ ඇති ශේෂවල නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| අංක | ශාකාව | වටිනාකම රු. |
|---|---|---|
| 1 | බුලත්සිංහල | 317,352 |
| 2 | පානදුර | 38,761 |
| 3 | මොරගහහේන | 13,645 |
| 4 | මීගමුව | 168,275 |
| 5 | අම්බලන්තොට | 4250 |
| 6 | ඇල්පිටිය | 2,185 |
| 7 | බටපොල | 58,986 |
| 8 | ගෝනගල්පුර | 682 |
| 9 | හම්බන්තොට | 532 |
| 10 | රන්න | 3,701 |
| 11 | දේවාලේගම | 71,743 |
| 12 | පොතුපිටිය | 1,261 |
| 13 | ඌව මාලිගාතැන්න | 1,329 |

| | | |
|---|---|---|
| 14 | එරාවූර් | 117,016 |
| 15 | නිකවැරටිය | 1,935 |
| 16 | නාත්තන්ඩිය | 56 |
| 17 | ගිරිඋල්ල | 142,749 |
| 18 | මුන්දල් | 448,160 |
| 19 | නවගත්තේගම | 1,507 |
| 20 | මාම්පුරි | 85,828 |
| 21 | පොල්පිතිගම | 377,173 |
| 22 | අබන්පොල | 3 |
| 23 | කල්පිටිය | 35,964 |
| 24 | වෙන්නප්පුව | 50,239 |
| 25 | බෝගස්වැව | 27,483 |
| | **එකතුව** | **1,970,815** |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. අත්තිකාරම් ගෙවුම් ශේෂයේ එකතුව රු.10,839,246 ක් කිසිදු පියවීමකින් තොරව වසරකට වඩා වැඩි කාලයක සිට රැඳී තිබුණි. විස්තර පහත දක්වා ඇත. | හඳුනාගත් කාර්ය නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලැබේ. | වැඩ අවසන් කර අවසන් ගෙවීම් සිදු කිරීමෙන් පසු අත්තිකාරම් ගෙවීම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|
| 03/06/16 | 75% උපදේශන ගාස්තු - 5 වන මහල | 56,250 |
| 19/04/2017 | කඹුරුපිටිය අභ්‍යන්තර වැඩ - 88% ගෙවීම් | 763,413 |
| 09/06/2020 | සීබීඑස් සීආර් වෙනස්කම් සඳහා අත්තිකාරම් 50% | 1,175,498 |
| 02/07/2021 | ගිවිසුම් අත්සන් කිරීමේ අදියරය මත 20% අත්තිකාරම් සහ ජීඒපී විශ්ලේෂණය හා එස්ආර්එස් ප්‍රලේඛණ මත 10% අත්තිකාරම් | 3,780,000 |
| **එකතුව** | | **5,775,161** |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| II. ස්වශක්ති ප්‍රදාන, අයකරගත හැකි ප්‍රතිපූරණ ගබඩාව, අත්තිකාරම් වශයෙන් ගෙවූ කුලිය, ණය ගැතියන් සහ ණයගැති ශේෂයන් - ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වල ඉදිරියට ගෙන එන ලද ශේෂයන්ගේ සැලකිය යුතු කාලයක සිට කිසිදු පියවීමකින් | කරුණාකර ඇමුණුම 01 බලන්න. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | | | |
|---|---|---|---|
| | තොරව පැවතුනි. දිගුකාලීනව ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට බැංකුව විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර ඇමුණුම 01 හි දක්වා ඇත. | | |
| III. | බදු මත ලැබිය යුතු ගිණුමේ රු.3,084,424 ක ශේෂයක් වසර 4 කට වඩා වැඩි කාලයක සිට (2018 සිට) පැවතුණි. එබැවින් මෙම ශේෂය නැවත ලබා ගැනීම සැක සහිතය. | වත්කම් හා බැරකම් කමිටු නිර්දේශ සමඟින් මෙම ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| VI. | රු.184,384,985 ක සමස්ථ හිඟ ශේෂයක් සහිත ණය සහ කල්බදු පහසුකම් පද්ධතියට ඇතුළත් නොකර හස්තමය ක්‍රමයට පවත්වා ගෙන ඇත. | ආර්ඩීබී විසින් එලිඩීබී බැංකුව අත්පත් කර ගැනීමෙන් පසු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත දත්ත සංක්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය සිදුවී ඇත. ලීසිං - තාක්ෂණික සහය මත විශාල මුදලක් දැරීමට සිදුවන බැවින් අක්‍රීය ලීසිං සටහන් කර හස්තමය ක්‍රමයට නඩත්තු කෙරේ. ඉදිරිපත් කළ පිරිවැය සාධාරණ නොවේ.<br>එස්එම්ඊ ණය- 2008 දී එලිඩීබී එස්එම්ඊ බැංකුව අත්පත් කර ගත් අතර පසුව ආර්ඩීබී එලිඩීබී අත්පත් කර ගත්තේය, එහි ප්‍රතිඵලයක් ලෙස එක් පද්ධතියකින් තවත් පද්ධතියකට දත්ත සංක්‍රමණය වීම තරමක් සංකීර්ණ වේ. එබැවින්, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තොරතුරු අනුව එවැනි වාර්තා හස්තමය ක්‍රමයට පවත්වාගෙන යනු ලැබේ. | පද්ධතිය තුළ ණය සහ ලීසිං පහසුකම් වාර්තා කිරීමට නිසි යාන්ත්‍රණයක් ඇති කිරීම. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් වගකීම් යටතේ ණය ඇපකර වන්දි ශේෂය රු.17,685,884 ක් පෙන්වා තිබුණ අතර ඉහත ශේෂය තහවුරු කිරීමට සාක්ෂි | හඳුනාගත් කාර්ය නිවැරදි කිරීම සඳහා මෙම වර්ශය අවසානයේ පියවර ගනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සහ |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. ඉහත ඒවායින් රු.6,538,033 ක වටිනාකමක් කිසිදු ගණුදෙනුවකින් තොරව 2019 වර්ෂයේ සිට පැවත එන බව තවදුරටත් අනාවරණය විය. | | පවතින වෙනස්කම් සැසඳුම් කරන්න. |
| II. | පහත සඳහන් ශාඛා වල වසර 5 කට වඩා වැඩි කාලයක සිට (2018 සිට) පැවත එන හිමිකම් නොපෑ ශේෂ පැවතුණි. දිගුකාලීන නොගෙවූ හිමිකම් නොපෑ ශේෂ නිරවුල් කිරීම සඳහා බැංකුව විසින් සතුටුදායක ලෙස ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සඳහන් කරන ලද නොගෙවූ ශේෂ නිරවුල් කිරීම සඳහා අදාල ශාඛා සමග සම්බන්ධවී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන ගෙවිය යුතු හිමිකම් නොපෑ ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | |
|---|---|
| රත්නපුර | 1,278,647 |
| බලංගොඩ | 2,590,890 |
| ඇඹිලිපිටිය | 1,743,375 |
| යටියන්තොට | 3,678,537 |
| රුවන්වැල්ල | 1,958,491 |
| බස්නාහිර පළාතේ ශාඛා | 15,097,370 |
| **එකතුව** | **26,347,310** |

| | | | |
|---|---|---|---|
| III. | කාර්යමණ්ඩල සුභසාධන අරමුදලේ හා සහන විශේෂ චක්‍රීය අරමුදලේ පිලිවෙලින් රු.4,451,392 සහ රු.2,705,647 ක ශේෂයන් 2013 හා 2014 මුල්‍ය වර්ෂ වල සිට පැවත එන බව නිරීක්ෂණය විය. | හඳුනාගත් කාර්ය නිවැරදි කිරීම සඳහා මෙම වර්ශය අවසානයේ පියවර ගනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව කාර්යමණ්ඩල සුභසාධන අරමුදලේ හා සහන විශේෂ චක්‍රීය අරමුදලේ දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| IV. | ණය හිමි සමස්ථ ශේෂය රු.21,347,832 ක් සැලකියයුතු කාලයක සිට රැඳී තිබුණි. විස්තර පහත දක්වා ඇත. දිගුකාලීන නොපියවූ ශේෂ නිරවුල් කිරීම සඳහා බැංකුව විසින් සතුටුදායක ලෙස ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් හා බැරකම් කමිටු නිර්දේශ සමඟින් මෙම දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

V.

| **වර්ෂය** | **එක් එක් වර්ෂයේ නොපියවූ ශේෂ** |
|---|---|
| 2011 | 168,976 |
| 2012 | 321,437 |
| 2013 | 574,976 |
| 2014 | 5,390,944 |
| 2015 | 3,244,902 |
| 2016 | 1,812,223 |
| 2017 | 5,542,511 |
| 2018 | 950,026 |
| 2019 | 1,797,697 |
| 2020 | 740,534 |

| | |
|---|---|
| 2021 | 803,606 |
| **එකතුව** | **21,347,832** |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| I. | 2021 සැප්තැම්බර් 14 දිනැති 2021 අංක 13 දරන ශ්‍රී ලංකා මහ බැංකු නියමයේ 4.4 වගන්තිය | යොමු කරන ලද විධානයට අනුව, බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එම බැංකුව විසින්ම කිසියම් ණය ගැණුම්කරුවෙකුට ලබා දී ඇති ඕනෑම ණය පහසුකමක් අයකර ගැනීමට අරමුදල් සම්පාදනය නොකළ යුතුය. කෙසේ වෙතත්, පරීක්‍ෂා කරන ලද නියැදියේ අක්‍රීය ණය 36 ක මුළු හිඟ ශේෂය රු.2,609,690 ක් 2022 සැප්තැම්බර් 30 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ බැංකුව විසින් නිකුත් කරන ලද නව ණය සඳහා පියවා ඇති අතර ඉහත ගනුදෙනුකරුවන්ගෙන් බැංකුවට මුදල් ලැබී නොමැත. | නව ණය යොදා ගනිමින් පවතින අක්‍රීය ණය පියවීම සම්බන්ධයෙන් මහ බැංකුවේ නියෝග කඩකිරීම පිළිබඳ සාකච්ඡාවක් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් පැවැති අතර, එවැනි උල්ලංඝනයන් වැළැක්වීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීමට තීරණය විය. අදාළ ප්‍රදේශ ආවරණය වන පරිදි චක්‍රලේඛයක් (2010-05) අතිරේක x නිකුත් කරන ලදී. | ශ්‍රී ලංකා මහ බැංකුවේ උපුටා දක්වන ලද උපදෙස් පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| II. | 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම) රීතිය. | එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ යෝජනා ලැයිස්තුවට අනුව යූඑන්එස්ආර් ලැයිස්තුව යාවත්කාලීන කිරීමේදී කිසිදු ආයතනයක් හෝ පුද්ගලයන් විසින් කිසිදු ව්‍යාපාරික සබඳතාවක් පවත්වා හෝ සම්බන්ධ කර නොතිබීම සහතික කිරීම සඳහා ඇතුල්වීමේදී නම් කරන ලද අදාළ සියලුම පුද්ගලයින්ගේ හෝ ආයතන ලැයිස්තුවක් පවත්වාගෙන යාමට මෙන්ම පවතින | එකඟ විය, 2023 දක්වා ඒඑම්එල් පද්ධතියක් නොතිබීම සහ හස්තමය ක්‍රියාවලිය සිදු කිරීමේ දුෂ්කරතා හේතුවෙන්, බැංකුවට මාර්ගෝපදේශයට අනුකූල වීමට හැකියාවක් නොතිබුණි. 2023.04.01 දින සිට ඒඑම්එල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, ශාඛා මට්ටමින් පාරිභෝගිකයන් ඇතුළු වන අවස්ථාවේදී නම් කරන ලද පුද්ගලයින් පරීක්ෂා කිරීමට බැංකුවට හැකි විය. තවද, | උපුටා දක්වන ලද උපදෙස් පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | | | |
|---|---|---|---|
| | පාරිභෝගික පදනම පරීක්ෂා කිරීමට කිසිදු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට බැංකුව අපොහොසත් වී ඇත.<br>තවද, උකස් වෙන්දේසියේ ගැණුම්කරුගෙන් හැඳුනුම් පතේ පිටපතක් ලබා ගත් අතර, ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම පිළිබඳ ක්‍රියාමාර්ග පවත්වා ගැනීමට බැංකුව අපොහොසත් වී ඇත. ඒ හේතුවෙන් රු.500,000 ක දඩයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 පෙබරවාරි 21 දින පනවන ලදී. | බැංකුව විසින් අදාළ සියලුම යූඑන්එස්සීආර් ලැයිස්තුව පවත්වාගෙන යන අතර, උත්සාහයන් කිහිපයකින් පසු කාර්යසටහන පිරික්සීමේ ක්‍රියාවලිය 2023.08.21 දින ආරම්භ කර ඇත.<br>තවද, උකස් වෙන්දේසියේ ගැණුම්කරුගෙන් හැඳුනාගැනීමේ ලේඛනය ලබා ගැනීම සහ පාරිභෝගික නිසි සම්ප්‍රජන්‍යතාව (සීඩීඩී) පියවරයන් බැංකුව විසින් පවත්වාගෙන යන බවට අපි සහතික වෙමු. | |
| III. 2021- රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | 2022 මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික වාර්තාව සහ කෙටුම්පත් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික වාර්තා සමාගම තෝරාගැනීමට අදාළ පරිපාලනමය ගැටලුවක් හේතුවෙන් වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර අවසන් කර නොමැත. කෙසේ වෙතත්, වාර්ෂික වාර්තා සමාගම තෝරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>අපි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කෙටුම්පත් 2023 පෙබරවාරි මස අවසන් වන විට අවසන් කර විගණකවරුන් වෙත ඉදිරිපත් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළෙමු. කෙසේ වෙතත්, බැංකුවට අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ පසු 2023 මාර්තු 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අනුමැතිය ලැබුණි. | උපුටා දක්වන ලද උපදෙස් පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| IV. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව 2.1.1 සහ | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමකින් | අදාල අධිකාරීන්ගේ අනුමැතිය ලබා ගන්නා තෙක් 2015 ආර්ඩීබී ප්‍රසම්පාදන | අදාල මාර්ගෝපදේශ පිළිපැදීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | |
|---|---|---|
| 2008 මාර්තු 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ පීඑෆ් /429 (i) | තොරව බැංකුව විසින් සංවර්ධිත ප්‍රසම්පාදන අත්පොතක් භාවිතා කර ඇත . | අත්පොත වෙනුවට 2006 රජයේ ප්‍රසම්පාදන අත්පොත ක්‍රියාවට නැංවීමට බැංකුවේ කළමනාකාරිත්වය තීරණය කර ඇත (ඇමුණුම 2 ලෙස අමුණා ඇති ලිපිය). 2015 දී සකස් කරන ලද ආර්ඩීබී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සඳහා අලුතින් පත් කරන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |

### 1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. උපයන විට බදු /ඒපීඅයිටී<br>සෑම සේවා යෝජකයෙකුම තම කැමැත්ත ඇතිව ආදායම් බදු ගෙවීමට බැඳී සිටින එක් එක් සේවකයාගේ රැකියාවෙන් ලැබෙන ලාභ සහ ලාභ වලින් ආදායම් බද්ද අඩු කිරීමට අවශ්‍ය වේ. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වැනි වගන්තියට, දේශීය ආදායම් පනතේ 83 වැනි වගන්තියට, 2017 අංක 24 (2018.04.01 දින සිට ක්‍රියාත්මක වේ), 2000 ජනවාරි 31 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/06. සහ 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයට පටහැනිව, බැංකුව උපයන විට ගෙවීමේ (පීඒපීඊ- ඒපීඅයිටී) බද්ද රු. 43,321,736 ක් 2022 වසර සඳහා අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු කරනු වෙනුවට එහි සේවකයින් වෙනුවෙන් එහිම අරමුදල් වලින් ගෙවා තිබුණි. පීඊඩී 03/2016 අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ එස්ඕඊ හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ගෙවනු ලබන බදු අඩු කර අයිආර්ඩී වෙත ප්‍රේෂණය කිරීමට සහතික විය යුතුය. | 2010 වර්ෂයේදී එක් ආයතනයකට ඒකාබද්ධ වීමට පෙර පළාත් බැංකු හයේ ස්ථිර සේවකයන් සේවා යෝජකයා විසින් ගෙවන බදු සංරචකය දැරීමේ ප්‍රතිලාභය භුක්ති විඳ තිබුණි.<br>තවද, 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 45 (2) (ඇ) වගන්තියේ සඳහන් වන්නේ "එවැනි සියලුම නිලධාරීන් සහ සේවකයන් පැවරුණු බැංකුවේ හෝ බැංකුවල සහ එම බැංකුවේ හෝ බැංකුවක ස්ථිර තනතුරක් දරමින් සිටි බව ය. පැවරීමේ දිනට පෙර, එවැනි පැවරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ඔවුන් විසින් අත්පත් කරගත් බැංකුව සමඟ කලින් භුක්ති විඳි නියමයන් සහ කොන්දේසිවලට වඩා අඩු වාසිදායක නොවන නියමයන් සහ කොන්දේසි මත රැකියා පිරිනැමිය යුතුය. මෙම පදනම මත ආර්ඩීබී බැංකුවේ වියදමක් ලෙස සේවකයින්ගේ ගෙවන බදු වගකීම් අඛණ්ඩව දරයි. මීට අමතරව, ලංකා බැංකු සේවක සංගමය සමඟ ඇති සාමූහික ගිවිසුමේ විධිවිධාන යටතේ, බැංකුව විසින් අනෙකුත් රාජ්‍ය බැංකු මෙන් සේවකයින්ටද එම ක්‍රමයම අනුගමනය කරමින් පීඒපීඊ- ඒපීඅයිටී ගෙවමින් සිට ඇති අතර මෙය දේශීය ආදායම් පනත අනුව තහනම් ක්‍රියාවක් නොවේ. කෙසේ | සඳහන් කර ඇති උපදෙස් පිළිපැදීමට සහ ඒ අනුව බදු ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

වෙතත්, මුදල් අමාත්‍යාංශයේ උපදෙස් මත 2023 ජනවාරි මාසයේ සිට සේවක වැටුප් වලින් ඒපීඅයිටී කපා හරිනු ලැබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 359,115,328 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 775,504,600 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි, රු. 416,389,332, හෙවත් සියයට 53.7 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතු වන්නේ පොලී වියදම් ඉහළ යාම සහ පුද්ගලික වියදම් ඉහළ යෑමයි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සමඟ සසඳන ලද ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල විශ්ලේෂණය පහත පරිදි වේ.

| විස්තරය | විචලනය වැඩිවීම/ (අඩු වීම) ( රු. මිලියන) | විචලනය ප්‍රතිශතය | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| ණය හා අත්තිකාරම් මත පොලී ආදායම | 5,349.7 | 26.8 | දළ ණය ප්‍රමාණය සියයට **13** කින් වැඩි වීම හා පොලී අනුපාත වැඩි වීම |
| පාරිභෝගික තැන්පතු මත පොලී වියදම | 9,123.4 | 107.5 | පාරිභෝගික තැන්පතු මත පොලී අනුපාත වැඩිවීම |

### 2.3. අනුපාත විශ්ලේෂණය

පවතින තොරතුරු අනුව, බැංකුවේ වැදගත් අනුපාතයන් සහ ආංශික අනුපාතයන් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සමඟ සැසඳීම පහත පරිදි වේ.

| | ආංශික අනුපාත (බලපත්‍රලාභී විශේෂිත බැංකුවල) ප්‍රතිශතය | 2022 ප්‍රතිශතය | 2021 ප්‍රතිශතය |
|---|---|---|---|
| <u>ලාභදායක අනුපාත</u> | | | |
| ශුද්ධ ලාභ අනුපාතය (බ.ප.ලා) | 1.16 | 3.73 | 1.25 |
| ශුද්ධ පොලී ආන්තිකය | 2.05 | 6.18 | 6.08 |
| පොලී ආදායම මත ශුද්ධ පොලී ආදායම | 24.39 | 44.32 | 57.98 |
| මුළු ආදායම මත පොලී නොවන ආදායම | 1.41 | 2.57 | 3.87 |
| පොලී ආදායම මත පොලී පිරිවැය | 75.61 | 55.68 | 42.02 |
| මෙහෙයුම් වියදම් මත පිරිස් වියදම් | 67.10 | 76.95 | 80.1 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 0.14 | 0.51 | 0.13 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ | 2.32 | 8.32 | 1.99 |

| | | | |
|---|---|---|---|
| කොටසක ඉපැයුම | | 2.45 | 0.56 |
| **<u>වත්කම් තත්ත්වය</u>** | | | |
| අක්‍රිය අත්තිකාරම් අනුපාතය | | | 8.71 |
| හානිකරණ ණය ( 3 අදියර) අනුපාතය (%) (අදියර 3 හානිකරණයේ ශුද්ධ) (2022 සිට) | 9.04 | 6.53 | - |
| හානිකරණ ණය ( 3 අදියර) සිට 3 අදියර ණය අනුපාතය (%) (2022 සිට) | 31.36 | 31.95 | - |
| **<u>ප්‍රාග්ධන ප්‍රමාණවත්බවේ අනුපාත</u>** | **අවම අවශ්‍යතාවය** | | |
| පොදු ප්‍රාග්ධන ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | 7.5 | 8.29 | 8.72% |
| මුළු ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | 8.5 | 8.29 | 8.72% |
| මුළු ප්‍රාග්ධන අනුපාතය | 12.5 | 15.22 | 14.27% |
| **<u>ද්‍රවශීලතා අනුපාත</u>** | | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 20 | 27.83 | 26.18 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා පහත දැක්වෙන අස්පෘශ්‍ය වත්කම් දැනට භාවිතයේ නොතිබුණි. ඇමුණුම 02 හි විස්තර දක්වා ඇත. | කරුණාකර ඇමුණුම 02 හි සටහන 01 සිට 12 දක්වා බලන්න. | එම වත්කම් භාවිත කළ හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමට හෝ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| II. බැංකුවේ පහත දැක්වෙන අස්පෘශ්‍ය වත්කම් දැනට භාවිතයේ නොතිබුණි. ඇමුණුම 03 හි විස්තර දක්වා ඇත. | කරුණාකර ඇමුණුම 03 බලන්න. | එම වත්කම් භාවිත කළ හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමට හෝ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

### 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශාඛා 07 ක් තුළ පරීක්ෂා කරන ලද ණය ලිපිගොනු සාම්පලයේ දී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය වී ඇත.<br>• අළුත් කරන ලද රක්ෂණ සහතිකයක් නොමැති වීම.<br>• ණය ලබා දීමෙන් පසු පරීක්ෂණ වාර්තාවක් නොතිබීම.<br>• ණය අයදුම්පත කළමනාකරු විසින් | හස්තමය ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී මෙහෙයුම් ගැටළු කිහිපයක් වරින් වර සිදු විය හැක. එවැනි අවස්ථාවන්හිදී, ණය දෙපාර්තමේන්තුව එවැනි තොරතුරු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කරයි. තවද, ණය ප්‍රභව පද්ධතිය | අනුමත බලධාරියාගේ කොන්දේසි, නිකුත් කරන ලද චක්‍රලේඛ සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව ණය ලබා දීමට සහ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| අත්සන් කර නොතිබුණි.<br>• පත්ඉරු, ද්විතියික උකස් බැඳුම්කර, පාරිසරික ආරක්ෂණ සහතිකය, 2 වන ඇපකරු සඳහා 83 සහ 84 ආකෘති පත්‍ර, ඇපකරු CRIB වාර්තාව, ඉන්වොයිසි සඳහා සාධනය සහ සැපයුම්කරු ගෙවීම්, තක්සේරු වාර්තාව, ලේඛන සනාථ කිරීම යනාදියේ ලේඛන නොමැතිකම හෝ අසම්පූර්ණ ලියකියවිලි. | (එල්ඕඑස්) ලෙස හඳුන්වන නව ණය අනුමත කිරීමේ ක්‍රමයක් බැංකුව ක්‍රියාත්මක කරයි. මෙය නවීන තාක්ෂණය පදනම් කරගත් පද්ධතියකි. තෝරාගත් ණය වර්ග සඳහා, එල්ඕඑස් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වේ. එබැවින්, එල්ඕඑස් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ පසු එවැනි දෝෂ සහ අතපසුවීම් වලක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව ණය ලිපිගොනුවල හඳුනාගෙන ඇති මෙවැනි අඩුපාඩු නිවැරදි කරන ලෙස සියලුම ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන් උපදෙස් දී ඇත. තවද, ශාඛා මෙහෙයුම්වල හඳුනාගැනීමේ අඩුපාඩු නිවැරදි කිරීම පිළිබඳ තහවුරු කිරීම් ශාඛා විසින් මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන මාසික වාර්තා මගින් ලබා ගනී. | එසේම ණය ලබා දීමට පෙර අවශ්‍ය සියලුම ලියකියවිලි ලබා ගැනීම සහ එම ලියකියවිලි වල සම්පූර්ණත්වය සහතික කිරීම අවශ්‍ය වේ. |

**3.3. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
